# 14 වන දවස

## "ඔබගේ රාජ්‍යය පැමිණේවා"

දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආරම්භ වනුයේ ඉතා කුඩාවෙනි. **"මහා ගසක් වූ අබ ඇටයකට එය සමාන ය. අහසේ කුරුල්ලෝ අවුත් එහි අතු පතරෙහි ලැගුම් ගත්හ"** (ශු. ලූක් 13:19). ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීමෙන් දේව රාජ්‍යයේ උදාව ආරම්භ වී ඇත. ඔවුන් වහන්සේගේ මරණය, උත්ථානය හා ශුද්ධාත්ම වැගිරීම කරණකොටගෙන ඔවුන් වහන්සේ තුළ දේව රාජ්‍යය පූර්ණ වී ඇත.

පුද්ගලයා, පවුල හා සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික ක්ෂේත්‍ර තුළ දේව රාජ්‍යය උදා කිරීමට අපට මෙහෙවරක් පැවරී ඇත. දෙවියන් වහන්සේගේ රාජ්‍යය කවර කලෙක පහළ වන්නේදැයි පරිසිවරුන් ඇසූ බැවින් ඔවුන් වහන්සේගේ ඔවුන්ට උත්තර දෙමින් **"දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඇසට පෙනෙන අයුරින් නොපැමිණෙයි. මෙන්න මෙතැනය අන්න අතනය යි කිව නොහැකි ය. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ (ඔබ තුළය, ඔබ අත ළඟය) අතරෙහි ය"**යි වදාළ සේක (ශු. ලූක් 17:20-21). දේව රාජ්‍යය ගොඩනැඟීමට; දැකීමට පිපාසා වෙමු. කැප වෙමු. වැය වෙමු. මේ අපගේ කොටසයි. දේව රාජ්‍යය උදා කිරීම හා පූර්ණ කිරීම දෙවියන් වහන්සේගේ ක්‍රියාවයි.

**දවස පුරා :-**
- ✵ දෙවි රජය රජයන අයුරු දකින්නට ඇවිත් බලන්න.
- ✵ ලූක් 13:18-21
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 291